Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**06 ශ්‍රේණිය** වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 **21 S**

**සිංහල භාෂාව හා සාහිත්‍යය** **කාලය පැය දෙකයි**

නම / විභාග අංකය :

සැලකිය යුතුයි :- ● සියලුම ප්‍රශ්න වලටපිළිතුරු සපයන්න.

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(01) සිංහල අක්ෂර මාලාවේ ඇති ස්වර ගණන වන්නේ ,
i) 10 කි. ii) 18 කි. iii) 5 කි. iv) 42 කි.

(02) සිංහල අක්ෂර මාලාව හා සම්බන්ධ වැරදි කියමන තෝරන්න.
i) ස්වරයක් තනිව උච්චාරණය කළ හැකිය.
ii) ස්වරයක් ඊට නියමිත රූපයෙන් ම ලියන්නේ වචනයක මුල් ශබ්දය හැටියට යෙදෙන අවස්ථාවලදී පමණි.
iii) සෑම ව්‍යඤ්ජනයක් ම හල් කළ හැකිය.
iv) ව්‍යඤ්ජනයක් තනිව උච්චාරණය කිරීම අපහසුය.

03) අනුක්ත නාම පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
i) කුරුල්ලෝ , වැඩිහිටියන් , කවීන්. ii) ළමයි , ගුරුවරු , උගතුන්.
iii) ඔවුන් , සිංහයන් , රෝගීන්. iv) දරුවන් , වෛද්‍යවරු , තරුණයන්.

**● 4, 5 ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.**

04) i) රාස්සි ළිපක් පෙන්නුවේය. ii) මා පාඩම් කළෙමි.
iii) ඔවුහු සෙල්ලම් කළෙහු. iv) ළමයා පැළයක් සිටුවයි.

05) i) ගස් සුළඟට සෙලෙවෙති. ii) තාරකා අහසේ බබළති.
iii) ඔවුහු පාඩම් කරති. iv) සමනලයන් මල්පැණි බොති.

06) හිස්තැනට සුදුසු වචනය තෝරා යටින් ඉරක් අඳින්න.
අඳුර වැටෙත් ම කඳවුරු දෙකෙහි ම රකවල් .................. විය.
i) බිය. ii) බඳ. iii) තර . iv) බර.

07) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
i) දර්ශනය , විදේශික , ඓතිහාසික ii) ප්‍රතිඵල , ලේඛකයෝ , ඡායාරූප
iii) ආවේණික , සංරක්ෂණය , පෝෂනය iv) සම්ප්‍රදාය , නිර්මානය , ස්වාධීන

**● පහත ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කිරීමට අදාළ පදය තෝරන්න.**

08) බැද්දට ............................ පැයුවා වගේ.
i) ඉර ii) හඳ iii) තරු iv) මල්

09) වක්කඩේ ............................ හැංගුවා වාගේ.
i) ගොයම් ii) පැණි iii) හකුරු iv) වී

**● 10, 11 ප්‍රශ්නවල විරුද්ධාර්ථ පදය නිවැරදිව යෙදී ඇති පිළිතුර වන්නේ,**

10) i) චංචල - නිශ්චල ii) විශේෂ - සුවිශේෂ iii) පළල - පුළුල් iv) ආරම්භය - පටන්ගැන්ම

11) i පිවිතුරු - පිරිසිදු ii) මිහිරි - ඉමිහිරි iii) නිති - නිබඳ iv) ඇත - මෑත

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

12) ප්‍රථම පුරුෂ බහු වචන උක්ත පදයකි.
i) නුඹලා ii) ගොවියන් iii) කාන්තාවන් iv) ගුරුවරු

13) යුගල පදයක් නොවන්නේ,
i) ඉඩම් - කඩම් ii) රළු - පරළු iii) උත්තම - අධම iv) ළමයි - බමයි

• **14, 15 ප්‍රශ්නවල ගැළපෙන තනි පදය තෝරන්න.**

14) රාත්‍රි කාලයේ හැසිරෙන.
i) නිශාචර ii) වනචර iii) දිවාචර iv) ජලතර

15) තමා උපන් රටට ආදරය කරන්නා,
i) දේශප්‍රේමීයා ii) දේශද්‍රෝහීයා iii) ස්වදේශිකයා iv) පරාධීනයා

• **16, 17 ප්‍රශ්නවල දී ඇති පදයට සමාන පදයක් නොවන පදය තෝරන්න.**

16) සඳ - සොමි, තරිඳු , නිරිඳු, තරුපති

17) මාතෘ භූමිය - මවුබිම , නිජබිම , ජාතභූමි , දිනමිණ

18) පහත සඳහන් වාක්‍යයේ නාම විශේෂණ පදය වන්නේ,
" කියවීම සඳහා හොඳ පොතක් තෝරාගන්න " යැයි ගුරුතුමා පැවසුවේය.
i) ගුරුතුමා ii) පොතක් iii) කියවීම iv) හොඳ

19) නොගැළපෙන පිළිතුර තෝරන්න.
i) කාව්‍යශේඛරය - තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
ii) ගුත්තිල කාව්‍ය - වැත්තැවේ හිමි
iii) කව්සිළුමිණ - ඊ . තෙන්නකෝන් මහතා
iv) පුංචි පැළේ ගස වෙනා- කේ ජයතිලක මහතා

20) මහාප්‍රාණ අක්ෂර නොයෙදුණු පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
i) ඡන්දය, ස්ථානය, ධර්මය, භයානක
ii) රාක්ෂයා, දණ්ඩ, පොකුණ, කඩය
iii) ධවල, රාජධානිය, අධිෂ්ඨානය, සමෘද්ධිමත්
iv) ප්‍රතිඵල, ආරුඪ, සංඛ්‍යාව, අවබෝධය

( ලකුණු 2 x 20 = 40)

## II කොටස

**සියලුම ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 125 කට නොඅඩු රචනයක් ලියන්න.
i) මිහිකත සුරකින - තුරුලිය
ii) මා කිය වූ හොඳම පොත
iii) මගේ මවුබිම වාසනාවන්
iv) උදෑසන අසිරිය
( ල. 15 )

02) පහත සඳහන් ප්‍රකාශය ඇතුළත් පාඩම , කවුරුන් විසින් කාහට කියන ලද්දක් දැයි ලියන්න.
i) " අපි තොප විසින් අප හැම දෙන කෑ නොදෙම් හ."
ii) " මම මහනුවර අසල ගම්වැසියෙක් මි. මගේ භාර්යාව හා දරුවෝ මන්දාරම්නුවර වෙසෙති. ඔවුන් බැලීමට යාම සඳහා ඉඩ දුන මැනව."
iii) " මාගේ පරම මිත්‍ර වූ තොපි මට කවර හෙයින් දාමරික වූ හු ද? "
iv) " හනික, හනික, බලා ඉන්ට කල් නෑ. අප හැම ම බඩගින්නේ "
v) " හා හා මම එහෙමත් කරනවද? "
( ල. 15 )

03) සුදුසු විරාම ලකුණු යොදන්න.
i) අනේ ඇයි මෙහෙම වුණේ
ii) මේ රෑ දුපත වටේ ඔරු පදින්න ගියොත් ඔරුවේ කෑලි හම්බ වෙන්නේ නෑ ජින්නා කීය
iii) ආහාර පිසීමේදී සුදුරු මහදුරු ද එකකු කර ගනිති
iv) රැස්වීම පෙ ව 7ට ආරම්භ වන බව විදුහල්පතිතුමා පැවසීය
v) උපාලි මහත්තයා අර බලන්න
( ල. 10 )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

04) පාසලේ පැවැත්වුණු තෑගී දීමේ උත්සවය ගැන විස්තර කරමින් වෙනත් පාසලකට අස් වී ගිය මිතුරාට ලිපියක් ලියන්න.

නැතහොත්

15 වෙනි උපන්දිනය සමරන වැඩිමහල් සොහොයුරියට සුදුසු සුබපැතුම් පතක් සකස් කරන්න. ( ල. 10 )

05) 1840 මැයි පළමුවන දින එංගලන්තයේ දී ලෝකයේ ප්‍රථම තැපැල් මුද්දරය නිකුත් කරන ලදී. එය හැඳින්වෙන්නේ " පෙනී බ්ලැක් " නමිනි. එම මුද්දරය 1840 මැයි හයවන දින සිට භාවිතයට ගැනිණි. වික්ටෝරියා රැජිනගේ උඩුකයේ රූපය සහිත එම මුද්දරයේ වටිනාකම පැන්ස 01 කි. පෙනී බ්ලැක් මුද්දරයේ, නිකුත් කළ රට සඳහන් නොවේ. මුද්දර වල රට සඳහන් නොකිරීමේ සම්ප්‍රදාය තවමත් එංගලන්තයේ පවතී. රටේ නම සඳහන් නොකර මුද්දර නිකුත් කරන රට එංගලන්තයයි.

i) ලෝකයේ ප්‍රථමවරට තැපැල් මුද්දරය නිකුත් කරන ලද්දේ කවදාද?
ii) එය හැඳින්වූයේ කිනම් නමකින්ද?
iii) එහි දක්නට ලැබෙන්නේ කිනම් රූපයක්ද?
iv) එම මුද්දරයෙහි විශේෂ ලක්ෂණය කුමක්ද?
v) එම මුද්දරයේ වටිනාකම කොපමණද? ( ල. 8 )

06) මෙම කවිය සම්පූර්ණ කරන්න.

නිති ගේ දොර ඇමද
කැලි කසල දැක නොම ඉද
.........................................................
......................................................... ( ල. 2 )

ඉස්කෝලෙට ඉස්කෝලෙන් උදව්වක්...
Iskolee.com
ප්‍රශ්න පත්‍ර ඇතුලු බොහෝ දේ PDF ආකාරයෙන් නොමිලේ ලබා ගන්න..

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# තෙවන වාර පරීක්ෂණය - 2019

## සිංහල භාෂාව හා සාහිත්‍යය

06 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

### සිංහල භාෂාව හා සාහිත්‍ය - I

01) 18 කි.
02) සෑම ව්‍යඤ්ජනයක්ම හල් කළ හැකිය.
03) ඔවුන්, සිංහයන්, රෝගීන්.
04) ළමයා පැළයක් සිටුවයි.
05) ඔවුහු පාඩම් කරති.
06) තර
07) දර්ශනය, විදේශික, ඓතිහාසික.
08) හඳ
09) හකුරු
10) චංචල - නිශ්චල
11) ඈත - මෑත
12) ගුරුවරු
13) උත්තම - අධම
14) නිශාචර
15) දේශප්‍රේමියා
16) නිරිඳු
17) දිනමිණ
18) හොඳ
19) කවිසිළුමිණ - රැ . තෙන්නකෝන්
20) රාක්ෂයා, දණ්ඩ, පොකුණ, කඩය

(ලකුණු 2 x 20 = 40)

### සිංහල භාෂාව හා සාහිත්‍ය - II

01) රචනය සඳහා ලකුණු ක්‍රමය.

- මාතෘකාවට අදාළ සාරවත් අදහස් ( අන්තර්ගතය ) - 08
- භාෂා රීතීන් අනුගමනය ( උක්තාඛ්‍යාත සම්බන්ධය, අක්ෂර වින්‍යාසය ) - 03
- ශිල්පීය දක්ෂතා ( පද බෙදීම , ඡේද වෙන් කිරීම , විරාම ලක්ෂණ හා අත් අකුරු ) - 03
- සමස්තය - 01

මුළු ලකුණු 15

02)

| පාඩම | කාවිසින් | කාහටද? |
|---|---|---|
| නලපාන ජාතකය | බෝධිසත්වයෝ | උදක රාක්ෂයාට |
| රාසිං දෙයියන්ට බැණ වැදුණ මුරකරුවා | රාජසිංහ රජතුමා | මුරකරුට |
| සතුරු මිතුරුව | මහාසේන රජතුමා | මේඝවර්ණ ඇමතියාට |
| චීචෙං චුලංගෙං යමු කිරි නැනෝ | පොරමොලා | ගාමා හා කයිරාට |
| නරි නයිදේ රැවටිච්චී | ඉබ්බා | මාන කොකාට |

( ල. 3 x 5 = 15 )

03) විරාම ලක්ෂණ

i) අනේ! ඇයි එහෙම වුණේ?
ii) "මේ රෑ දුපත වටේ ඔරු පදින්න ගියොත් ඔරුවේ කැලි හම්බවෙන්නෙත් නෑ" ජින්නා කීය.
iii) ආහාර පිසීමේදී සුදුරු , මහදුරු  එකතු කර ගනිති.
iv) රැස්වීම පෙ. ව. 7 ට ආරම්භ වන බව විදුහල්පතිතුමා පැවසීය.
v) උපාලි මහත්තයා, අර බලන්න. ( ල. 2 x 5 = 10 )

04) ලිපිය

i) ආකෘතිය - 04
ii) අන්තර්ගතය - 02
iii) වියරණ විධි - 02
iv) ශිල්පීය දක්ෂතා - 02 - (ල. 10)

10

05) i) 1840 මැයි පළමු දින. - (ල. 1)
ii) පෙනී බිලැක්. - (ල. 2)
iii) වික්ටෝරියා රැජිනගේ උඩුකය.. - (ල. 2)
iv) නිකුත් කළ රට සඳහන් නොවීම. - (ල. 2)
v) පැන්ස 01 කි. - (ල. 1)(ල. 8)

06)

| | |
|---|---|
| නිති ගේ දොර | ඇමද |
| කැලි කසල දැක නොම | ඉඳ |
| උදෑසන | සවස ද |
| පහන් දල්වන විමන නො | වරද |

(ල. 2 )